අද අදහස

# සටන් විරාමය එළිපිටම කඩනවා නම් නිරීක්ෂණ කමිටුවලින් වැඩක් තියෙනවාද?

## යුද හමුදපති ලුතිනන් ජනරාල් සරත් ෆොන්සේකා

සංවාද සටහන
ප්‍රසන්න ෆොන්සේකා



සටන් විරාමයට මුවාවී ත්‍රස්තවාදීන් කරන ප්‍රචණ්ඩ ක්‍රියා නතර කොට ඔවුන් ගොඩනගා ගත් යුද ශක්තිය මර්දනය කරන තුරු මුදුව දිගින් දිගටම මෙහෙයුම් කරන බව යුද හමුදපති ලුතිනන් ජනරාල් සරත් ෆොන්සේකා මහතා පවසයි.

'සිළුමිණ' සමග විශේෂ සම්මුඛ සාකච්ඡාවකට එක් වෙමින් යුද හමුදපතිවරයා කියා සිටියේ රජය ඕනෑම මොහොතක සාම කතා ඇරැඹීමට සූදානම් මේ මොහොතේ ප්‍රචණ්ඩත්වය අතහැර සාමයට ඇති කැපවීම අවංකව පෙන්නුම් කළ යුතු බවය.

යුද හමුදපතිවරයා සමග පැවැති සාකච්ඡාව මෙසේ ය.

**යාපනය ප්‍රධාන කොට උතුරෙන් වාර්තා වන ප්‍රචණ්ඩ ක්‍රියාවන්හි වැඩිවීමක් දකින්න පුළුවන්. උතුරේ මේ වෙන්නේ මොකද කියන තැනින්ම මේ කතා බහ අරඹමු.**

සටන් විරාම ගිවිසුම පැහැදිලිවත් එළිපිටත් උල්ලංඝනය කරමින් ත්‍රස්තවාදීන් ප්‍රචණ්ඩ ක්‍රියා සිදු කරනවා. මම දන්නා විදියට සටන් විරාම ගිවිසුම අත්සන් කළදා පටන් එල්.ටී.ටී.ඊ. යට අවශ්‍ය උනේ රජයේ පාලන ප්‍රදේශවල මේ ප්‍රචණ්ඩත්වය ඇති කිරීමය. අවබෝධතා ගිවිසුමට පෙර රජයේ පාලන ප්‍රදේශවල බලපෑම් කරන්න ඔවුන්ට හැකියාව තිබුනේ නෑ. ඒත් ඉන් පස්සෙ ඇති වූ වාතාවරණය ප්‍රයෝජනයට ගෙන එල්.ටී.ටී.ඊ. ය යාපනය ඇතුළට අවි ගෙනාවා. යුද පුහුණුව දුන්නා. දැන් ඒ යුද පුහුණුව ලද අය යොදගෙන ආරක්ෂක අංශ, ප්‍රතිවිරුද්ධ පක්ෂ සාමාජිකයන්ට වගේම එල්.ටී.ටී.ඊ. යට එරෙහි ජනතාවටත් පහර දෙනවා. ඔවුන් ගේ අපේක්ෂාව හමුදව බිඳ දැමීමය.

### පහර දෙන්නේ කොටි

**නමුත් එල්.ටී.ටී.ඊ ය කියා සිටින්නේ මේ ප්‍රචණ්ඩ ක්‍රියා සිදු කරන්නේ තමන් නොවන බවයි. ඔවුන් කියන්නේ හමුදව යාපනයේ රැඳී සිටීමට අකමැති මහජනතාව මෙසේ හමුදවට විරෝධය පළ කරන බවයි.**

ඒ කතා බොරු. හමුදවට ප්‍රහාර එල්ල කිරීමට පැමිණ ප්‍රතිප්‍රහාරවලින් මියගිය අවි අතැතිව සිටි කිහිපදෙනා මෙහෙයුම් වලදී සැක පිට අත්අඩංගුවට ගත් එල්.ටී.ටී.ඊ සාමාජිකයන් බව පැහැදිලිව, හඳුනා ගෙන තිබෙනවා. ඒ වගේම බුද්ධි අංශ තොරතුරු මගින් ද ප්‍රහාර පසුපස සිටින්නේ එල්.ටී.ටී.ඊ ය බව තහවුරු කර තිබෙනවා.

**මේ පිළිබඳවත් එල්.ටී.ටී.ඊ ය කියා තිබුණේ මිය ගිය අය තම සාමාජිකයන් නොවන බවත් ඔවුන් සාමාන්‍ය වැසියන් බවත්**

කවුරු හරි එල්.ටී.ටී.ඊ ය යටතේ අවි පුහුණුව ලබල එල්.ටී.ටී.ඊ ය දෙන ආයුධ අරගෙන රජයේ හමුදවට පහර දෙනවා නම් ඔවුන් එල්.ටී.ටී.ඊ සාමාජිකයන් මිසක සාමාන්‍ය ජනතාව වන්නේ කොහොමද?

මම ඉතාම හොඳින් දන්නවා යාපනයේ සාමාන්‍ය ද්‍රවිඩ ජනතාව අවි ආයුධ ප්‍රතික්ෂේප කරන, ප්‍රචණ්ඩත්වය කෙරෙහි විශ්වාසය නොතබන සාමකාමී පිරිසක් බව. අපට පහර දෙන්නේ සාමාන්‍ය ජනතාව බව කීමෙන් එල්.ටී.ටී.ඊ ය කරන්නේ ඒ සාමකාමී ජනතාවට අපහාස කරමින් ඔවුන් ත්‍රස්තවාදීන් කිරීමයි එල්.ටී.ටී.ඊ යේ අවශ්‍යතාව.

**අද උතුරේ පවතින්නේ අප්‍රකාශිත යුද්ධයක් එහෙමත් නැත්නම් සෙවණැලි යුද්ධයක් බව සමහරු කියනවා.**

සටන් විරාම ගිවිසුමෙන් පසු පසුගිය කාලය දක්වා අපිට පහර දුන්නත් අපි ප්‍රතිප්‍රහාර එල්ල කළේ නැහැ. නමුත් අද අපට අපේ ආරක්ෂාවටත් රටේ නීතිය රකින්නත් වැඩ කරන්න වෙලා තියෙනවා. සටන් විරාමය හින්ද යුද්ධයක් නැහැ. ඒත් අපට පහර දුන්නොත් අපට ප්‍රතිප්‍රහාර එල්ල කරන්න වනවා. ඒ නිසා වෙන්නැති දැන් සෙවණැලි යුද්ධයක් පවතින බව කියන්නේ.

**සෝදිසි මෙහෙයුම් නොකළත් යාපනයට පිවිසෙන මාර්ගවල මාර්ග බාධක තිබුණ. ඒවායේ පරීක්ෂාවන්ට හොරෙන් මේ තරමට අවි ගේන්න ලැබුණේ කොහොමද?**

ක්ලේමෝ බෝම්බයක් කියන්නේ මහා විශාල දෙයක් නොවෙයි. එය හංගාගෙන එන්න පුළුවන්. සිමෙන්ති ලොරි, ලී ලොරි සිවිල් වාහන දහස් ගණන් ආවා. කළපුවේ අඳුරේ මුහුදු ගොස් අඳුරේ ම ගොඩට එන හැම ධීවරයෙක්ම පරීක්ෂා කරන්න ප්‍රායෝගිකව බැහැ. මුහුදේදී ලබා ගන්නා ආයුධ, පුපුරණ ද්‍රව්‍ය ලොකු මාලුවකුගේ බඩේ හංගා ගෙන එන්න පුළුවන්. හැම මාලුවාගේ ම බඩ පළන්න පුළුවන් ද? අනෙක් අතට අපි සෝදිසි මෙහෙයුම්, නිවාස සෝදිසි නතර කරා. එහි ප්‍රතිඵලය ලෙස ඔවුන්ට අවශ්‍ය දේ ගෙන ඒමට ලැබුනා.

**සටන් විරාම ගිවිසුම මේ ලෙස කඩවීම වළක්වා සාමය තහවුරු කිරීමට නම් ක්ෂේත්‍ර මට්ටමේ දෙපැත්තේම අණ දෙන්නන් සාකච්ඡා ඇරැඹිය යුතු බව සටන් විරාම කමිටු ප්‍රකාශකයකු කියා තිබුණා. මේ ගැන ඔබේ අදහස කුමක්ද?**

මම යාපනයේ අණ දෙන නිලධාරි ලෙස කටයුතු කරන විට මේ සාකච්ඡා පැවැත්වුණා. ඒ අතරේ එල්. ටී. ටී. ඊ. ය කිව්වා ඔවුන් කතා කරන්නේ අණ දෙන නිලධාරියා සමග පමණයි කියා. එවිට එහි කොටි දේශපාලන නායකයා ඉලම්පරිති.

එල්. ටී. ටී. ඊ. ය මීට පසු ඉලම්පරිති සාකච්ඡා කරන්නේ යාපනය ආඥපති සමග පමණයි කියන කොට සටන් විරාම නිරීක්ෂණ කමිටුව ඔය කතා කිව්වේ නැහැ. පොලිස් අධිකාරි විජේවර්ධන ඝාතනය කරන තෙක් සාකච්ඡාව තිබුණා. ඒත් මේ අතරේත් ඝාතන වුණා. අපි එක්ක කතා කරල යන ගමන් ඝාතන කරා.

උද්ඝෝෂණ සඳහා පාසල් වෙලාවේ ළමයි ගත්තා. නිරීක්ෂණ කමිටුව ඒවා හෙළා දකිනවා. නමුත් නැවත නැවතත් සිදු උනේ එයමයි. එක්කෝ නිරීක්ෂණ කමිටුව වැරැදි අවබෝධයකින් වැඩ කරනවා. නැත්නම් ඔවුන්ට ගිවිසුම කඩ කරන විට කළ හැකි දෙයක් නැහැ.

**ඔබ දක්වන මේ අදහස්වලින් පැහැදිලි වන්නේ සටන් විරාම ගිවිසුම සංශෝධනයට ලක් විය යුතු මතයේ සිටින බවයි.**

සටන් විරාමය එළිපිටම කඩවන විට එය වළක්වන්න බැරි නම් එය නිරීක්ෂණයෙන් එලක් තියෙනවද? වරද කරන අය ඒ වරද යළිත් කරන විටත් එය නතර කරන්න ගත යුතු ක්‍රියා මාර්ගයක් නැත්නම් මොකද කරන්නේ.

**සටන් විරාම කමිටුව කියන්නේ ගිවිසුම කඩ කිරීම් නිරීක්ෂණය මිස ඒවා නතර කරන්න තමන්ට පොලිස් බලතල නැති බව?**

වාර්තා පිටු දහසක් පිරවුවත් එයින් අවශ්‍ය දේ නොකෙරෙනවා නම් ඉන් එලක් තිබෙනවාද? රටේ දෙදෙනකු අතරේ ඇති කර ගන්නා ගිවිසුමක් කඩ කළ විට පවා ගත හැකි ක්‍රියා මාර්ග තිබෙනවා. එය දිගටම කඩ කරන විට ප්‍රකාශ නිකුත් කරාට වැඩක් නැහැ.

**හොඳයි මේ තත්ත්වය වළකා සටන් විරාමය පවත්වාගෙන යන්න ගිවිසුමට කළ යුතු සංශෝධන ගැන අදහස් තිබෙනවාද?**

අපි යෝජනා ගණනාවක් ඉදිරිපත් කර තිබෙනවා. අපි ඒවා ආරක්ෂක අමාත්‍යාංශයට ලබා දී තියෙනවා. පාසල් ළමයි පාසල් වේලාව තුළ දේශපාලන කටයුතු උද්ඝෝෂණ සඳහා යොදු ගන්නා අවස්ථා උදහරණයට ගන්න පුළුවන්. රටේ පවතින නීතිය නම් එවැනි විටක අධ්‍යාපන දෙපාර්තමේන්තුව විනයානුකූලව ක්‍රියා කිරීම. නමුත් උතුරේ ඒක නැහැ. සටන් විරාම ගිවිසුම සංශෝධනය කරන විට එය ගැන සැලකිය යුතුයි.

තවත් උදහරණයක් ගත හොත් පාලන ප්‍රදේශවල සීමා මායම් ගිවිසුම මගින් දක්වා තියෙනවා. මන්නාරම පාර ගතහොත් උතුරු එල්. ටී. ටී. ඊ. පාලන ප්‍රදේශයක්. දකුණ තියෙන විල්පත්තුවට කොටි පහළොවක් ඇවිත් කඳවුරක් ඉදි කළ හොත් ඒක කොටි පාලන පෙදෙසක් කියනවා.

මනිරාසකුලම් තව උදහරණයක්. එය රජයේ පාලන ප්‍රදේශයක්. නමුත් කොටි කඳවුරක් ඇති කළාම ඒක ගැන ගන්නා ක්‍රියා මාර්ගයක් ගිවිසුමේ නැහැ. හමුදව ලෙස අපි ක්‍රියා මාර්ගයක් ගත්තොත් ඒක යුද්ධය ඇරැඹීමක්.

**සටන් විරාමය තුළ එල්ටීටීඊය ප්‍රතිසංවිධානය වී තිබෙනවා. ඒ ගැන ඔබේ අදහස කොහොම ද?**

ඔවුන් හැමවිටම කළේ යුද ශක්තිය වර්ධනය කර ගැනීම. අපි අපේ මෙහෙයුම් නතර කළා. එයින් වාසිය ඔවුන්ට ලැබුණා. සටන් විරාම ගිවිසුම කියන්නේ ගිවිසුමෙන් ඉවත් වනවා නම් දින 14 කට පෙර දැනුම් දිය යුතු බව. ඒත් ඒ බවක් ප්‍රකාශ කර නැති වුණත් ඔවුන් ප්‍රචණ්ඩකාරීව හැසිරෙනවා. අපි වරදක් කළාමයි සිතමු. ඒත් එල්ටීටීඊයට ඇති අයිතිය මොකක්ද ඒක විසඳන්න. ආරක්ෂක හමුදවෙ අය මරන්න.

**මේ වන විට ක්ලේමෝ ප්‍රහාර ගණනාවක් එල්ල වී තිබුණත් තවමත් ඒ තත්ත්වය මර්දනය කරන්න බැරිවෙලා ඇත්තේ ඇයි?**

මම මීට පෙර කියූ පරිදි වසර ගණනාවක් තිස්සේ එල්ටීටීඊය මේ තත්ත්වය ඇති කරන්න සූදනම්ව සිටියා. ඒ කාලය තුළ අප නිහඬව සිටීමේ වාසිය ද ලබාගත්තා. ඒ නිසා මේ තත්ත්වය එක රැයින් මර්දනය කරන්න බැහැ. නමුත් අප සෝදිසි මෙහෙයුම් හා බුද්ධි තොරතුරු මගින් ප්‍රහාර ගණනාවක් වළක්වා ගත්තා. ඉස්සර අපට ගැහුවාම අපි හැංගුනා. බංකරයට ගිනි තියපු විට එය හැර ගියා. අද අපි ප්‍රතිප්‍රහාර එල්ල කරනවා.

පසුගිය දිනවල කොටි සාමාජිකයන් එයින් මිය ගියා. මම ඉතා පැහැදිලිව කියනවා උතුරේ මේ ඇති ප්‍රචණ්ඩත්වය නතර කර ගොඩ නගා ගත් යුද ශක්තිය මර්දනය කරන තුරු දිගටම මෙහෙයුම් කරන බව.

**ඔබ ගැන එල්ටීටීඊයේ තක්සේරුව මේ ප්‍රහාරවලින් පේනවා. එල්ටීටීඊය ගැන ඔබේ තක්සේරුව කොහොම ද?**

එල්ටීටීඊය මර්දනය කරන්න බැහැ කියා මම කවදවත් කියා නැහැ. බිමට වැටිල හිටි ඔවුන් පසුගිය කාලය තුළ යම් ශක්තියක් ගොඩ නගා ගත්තත් එය කිසිසේත් අභියෝගයක් නෙවේ. හත්දහසක පමණ පිරිසක් සිටින ඔවුන් ආයුධ ටිකක් එකතු කරගත්තත් අපට මුහුණ දීමේ හැකියාවක් එල්ටීටීඊයට නැහැ. ඔවුන්ට කළ

හැක්කේ මේ වගේ නිවට බියගුළු ප්‍රහාර එල්ල කිරීම පමණයි.

**මහජනතාව අතර සැඟව සිට එල්ල කරන මේ ප්‍රහාරවල අරමුණ මහජනතාව හා හමුදාව බිඳවැටීම බවයි පේන්නේ...**

එය ඉතා බාල උපක්‍රමයක්. ඒ ත්‍රස්තවාදී ප්‍රහාරයේ අරමුණ අපේ ප්‍රතිප්‍රහාරයෙන් ජනතාවට හානි සිදුකරවීමයි. එමඟින් මහජනතාව හමුදාව කෙරෙහි කළකිරවන්න ඔවුන් බාල උත්සාහයක් දරනවා.

**උතුරේ පවතින මේ තත්ත්වයට මුහුණ දිය යුත්තේ කොහොම ද?**

උතුරේ අර්බුදය විසඳිය හැක්කේ සාම කතා මඟින්. ජනාධිපතිතුමා පැහැදිලිව කියනවා ඕනෑම මොහොතක සාම කතා අරඹන්න රජය සූදානම් බව. සාම කතා අරඹන්න එල්ටීටීඊය අවංකව කැප වනවානම් ඔවුන් මේ ප්‍රචණ්ඩ ක්‍රියා අත්හළ යුතුයි. 1995-2002 අතර කාලය තුළ යාපනයේ ජන ජීවිතය ඉතා හොඳින් තිබුණා.

ඒ තත්ත්වය වෙනස් කළේ එල්ටීටීඊය. ගිවිසුමට පෙර ළමයින්ට පාසල් යන්න, බඩු විකුණා ගන්න, නිදහසේ ඉන්න ඉඩ තිබුණා. කවුරුවත් ඒ අයගෙන් බදු ගන්න ආවේ නෑ. කප්පම් ගන්න ආවේත් නැහැ. ප්‍රශ්න ඇති කරන්නේ එල්ටීටීඊයයි.

අපි කරන්නේ ජනතාවගේ, රටේ ආරක්ෂාව තහවුරු කොට නීතිය හා සාමය පවත්වා ගෙන යාම. අපට බෑ අපේ සෙබළුන් මරන්න ඉඩ දෙන්න. ඒ නිසා අපි කරන්නේ රටේ නීතිය ක්‍රියාත්මක කිරීමයි.

**ඔබ ඊයේ පෙරේදාත් යාපනයට ගියා. සෙබළුන් මේ ගැන දක්වන අදහස මොකක්ද?**

අපි වෘත්තීය හමුදාවක්. ඉතාම ඉවසීමෙන් හා වගකීමෙන් තමයි අපේ සෙබළු ක්‍රියා කරන්නේ. අපි පැහැදිලි නියෝග දී තිබෙනවා තත්ත්වය මර්දනය කරනතුරු දිවාරාත්‍රී නොකඩවා මෙහෙයුම් කරන්න.

අපි ඕනෑම දෙයකට මුහුණ දෙන්න සූදානම්. අපේ සෙබළු රට වෙනුවෙන් කැපවූ පිරිසක්.

**ඡායාරූපය - කවීන්ද්‍ර පෙරේරා**